44148

OL/2025(2026)/47/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | | |
|---|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II | පැය තුනයි |
| இலக்கிய நயம் சிங்களம் | I, II | மூன்று மணித்தியாலம் |
| Appreciation of Sinhala Literary Texts | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: ..........................................

නිවැරදි බවට සහතික කරමි.

..........................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**උපදෙස්:**

- ✳ I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.
- ✳ I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය. **මේ සඳහා සපයා ඇති ඉඩකඩ පමණක් භාවිත කරන්න.**
- ✳ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.
- ✳ I පත්‍රය සඳහා ලකුණු **40**ක් ද II පත්‍රය සඳහා ලකුණු **60**ක් ද හිමි වේ.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

**I පත්‍රය**

| ප්‍රශ්න අංක | | ලකුණු |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

| | |
|---|---|
| ..................... පළමුවන පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... දෙවන පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ගණිත පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ප්‍රධාන පරීක්ෂක | ..................... සංකේත අංකය |

[දෙවැනි පිටුව බලන්න.

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "නුවණැති තැනැත්තන් පළමු ව ලබන්නා කැමැත්තෙමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....................................................................................................

(ii) කුරිරු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
මදුරු මැසි කැලන්ගේ තුඩ'ගෙහි විසය
රුදුරු **නුහුසුවන්ගේ** වල'ගෙහි විසය
නපුරු දුදනන්ගෙ **සියල'ගෙහි** ම විසය

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

.....................................................................................................

.....................................................................................................

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**නුහුසුවන්ගේ** .....................................................................

**සියල'ගෙහි** .....................................................................

(iii) "මාමා බදා වැළඳගන්ට තරම් සංතෝෂයක් මට ඇති විය"

(අ) මෙය කාගේ සිතිවිල්ලක් ද?

.....................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා කළ රචකයා නම් කරන්න.

.....................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iv) "කරච්චලේ, ඉක්මනට යනව ද නැද්ද?"

(අ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

...................................................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය නම් කරන්න.

...................................................................................................................................

(v) "අයියේ කුඩුව බලන්ට යමු."

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

...................................................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා කළ රචකයාගේ නම ලියන්න.

...................................................................................................................................

(ලකුණු 04 × 5 = 20යි)

20

**2.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

එකල කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ බස් අසා "ඉදින් සබඳ, තෙපි ම වේද දන්නා ඒ මට ඇයි දැයි කීම් නම් මුන්ගේ ළය පැළී යන්නේ ය, එහෙයින් මුන් අස්වසා කියම්යි සිතා "ප්‍රභාවතීනි, තොප මේ ලෙස යාඥා වෙමින් සිටිය දී කුමක් නිසා තොප කීවා නො කෙරෙම් ද තොප කෙරෙහි මාගේ මඳකුත් කෝපයක් කනස්සල්ලෙක් නැත්තේ ය, තව ද තොපි කිසි විටකත් නො බව, තව ද කලණ ගුණයන් ඇති රාජපුත්‍රිය, සත්‍ය වචනයක් ඇති කියම්. මමත් මෙතැන් පටන් කයින් වචනින් මනසින් අප්‍රියයක් නො කෙරෙම්. මේ එක මදු රජ කුලය තබා මෙබඳු නො යෙක් සිය ගණන් රාජ කුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇර ගෙන යන්ට සමර්ථ වුවත් මම තොප නිසා මාගේ එබඳු රාජ්‍ය ශ්‍රීය හැර හීන ක්‍රියා කෙරෙමින් මෙතෙක් දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳු වූ මා පෙනී සිටිය දී තොපට කිසි යම් භයකුත් නැත්තේ ය"යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජපිරිවරින් පිරිවරන ලදුව ක්ෂත්‍රියමාන උපදවාගෙන "මා ජීවත් ව සිටිය දී මාගේ භාර්යාව අනිකෙකු ඇර ගෙන යෙතැ"යි කේශර සිංහරාජයකු මෙන් පැලඹෙමින් "මේ සියලු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්ව"යි ඇත මැත පනිමින් අභීතනාද පවත්වමින් අත්පොළසන් දෙමින් "දැන් දැන් ඒ කොල්ලන් ජීවග්‍රාහයෙන් අල්වාගෙන එමි." සියලු අන්තඃපුර වාසීන් අස්වසා "තව ද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවෙක්හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව. දැන් දැන් ශත්‍රුමර්ථනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමර්ථ්‍යය බලව." යනාදීන් අභීත නාද පවත්වමින් "ශත්‍රුමර්ථනය කිරීම මට භාර ය, තෙපි තොපගේ මාලිගාවට ගොස් ඉස්සෝධා නහා සැරහී ගන වැද හිඳුවයි ප්‍රභාවතීන් එතනින් නික්මවූහ. එකල මදු රජ්ජුරුවෝ ද කුස රජ්ජුරුවන්ට පිරිස් සරහන පිණිස අමාත්‍යයන් යවූහ. ඒ නියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වටතිරයක් බැඳ එලවන ලද ඒ මඟුල්කපුවා විසින් කරන ලද දැළි රැවුලු අන්දම් තිබීම් ඇතිව ඉස් සෝධා නහා සියලු රාජාභරණයෙන් සැරහී ඇමති මඬුලු ආදී දග මේ තැන් පිරිවරා මාළිගාවට යෙමින් අත් පොළසන් දෙමින් සියලු අන්තඃපුර සත්වයන් බල බලා සතුටුවන පරිද්දෙන් අභීත නාද පැවැත්වූහ.

(i) ඡේදයේ සඳහන් පරිදි කුස රජතුමා පබාවතියට සැනසිලි වදන් පැවසීමට සිතුවේ කුමක් නිසා ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 04යි)

(ii) "කලණ ගුණයන් ඇති රාජපුත්‍රිය, සත්‍ය වචනයක් ඇති කියමි. මමත් මෙතැන් පටන් කයින්, වචනින්, මනසින් අප්‍රියයක් නොකරමි." මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 04යි)

(iii) ඉහත ඡේදයට අනුව කුස රජු තුළ පබාවතිය කෙරෙහි පැවති හැඟීම් කෙබඳු ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 06යි)

(iv) කුස රජුගේ එඩිතරබව හා තේජශ්‍රීය ඡේදයේ ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

.......................................................................................................... (ලකුණු 06යි)

20

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

**නැතහොත්**

දිසාපති කාමරේ දී ය

එක් යුගයක ජීවනයේ සරතස නිවු මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවනයේ සරතස නිවු මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යම් කුමට ද ඔබගේ අවසර?

(i) "බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි"

මේ පද්‍ය ඛණ්ඩයෙන් ධ්වනිත වන අදහස කුමක් ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 04යි)

(ii) මිතුරාගේ නිහඬ ප්‍රතිචාරය පෙන්වීමට කවියේ යෙදී ඇති අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 04යි)

(iii) මෙම පද්‍ය පන්තියේ සඳහන් මිතුරන් දෙදෙනාගේ අතීත මිත්‍රත්වයේ ස්වරූපය නිරූපණය වන අවස්ථා **දෙකක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

................................................................................................................. (ලකුණු 06යි)

(iv) මෙම පද්‍ය නිර්මාණයෙන් මිතුරාගේ චර්යාව සියුම් විවේචනයකට ලක් කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

................................................................................................................. (ලකුණු 06යි)

20

* *

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

**සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II**
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.
※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන් වන් කරල් බරවී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නො වන යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියළි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැතී
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

- මෙම පද්‍ය පන්තියට පාදක වූ අත්දැකීම
- භාෂා භාවිතයේ විශේෂතා
- යොදා ගත් ආකෘතිය
- අවස්ථා හා සිද්ධි නිරූපණයට කවියා දැක්වූ දක්ෂතාව
- සුන්දර හාමිගේ ජීවන රටාවෙහි විශේෂතා (ලකුණු 06 × 5 = 30යි)

[අටවැනි පිටුව බලන්න.

2. 'තුංමංහංදිය' නවකතාවට පාදක වූ සමාජ පසුබිම නිර්ව්‍යාජ ලෙස නිරූපණයට කතුවරයා දැක්වූ දක්ෂතාව උදාහරණ **තුනක් වත්** ඇසුරෙන් අගයන්න. (ලකුණු 15යි)

3. තාත්වික ලෙස චරිත නිරූපණය සඳහා කතුවරයා දැක්වූ කුසලතාව 'වැලපීම' කෙටිකතාව ඇසුරෙන් උදාහරණ **තුනක් වත්** දෙමින් විමසන්න. (ලකුණු 15යි)

4. ජාති, ආගම් භේදයකින් තොර ව මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්න හා ගැටලු එක හා සමාන බව 'උතුරෙන්' නම් වූ පද්‍ය පන්තිය ඇසුරෙන් නිදර්ශන **තුනක් වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

5. රසවත් කථා වස්තු නිර්මාණයෙහි ලා ධර්මසේන හිමියන්ගේ කුසලතාව 'නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව' පාදක කොට ගෙන නිදසුන් **තුනක් වත්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)


***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD

CASH ON DELIVERY | VISA | mastercard | KOKO

037 20 60 110
071 77 74 440

Buy Now
CLICK HERE